# ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

## ප්‍රවාහන අංශය

# කාර්යසාධන වාර්තාව - 2022

**7 වෙනි මහල**
**සෙත්සිරිපාය - අදියර II**
**බත්තරමුල්ල**

**2023- මැයි**

## පටුන

**01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය**......................................................03
1.1 හැඳින්වීම....................................................................................................................03
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු.........................................................................05
1.3 ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන්.......................................................................................05
1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන.........................................................................................06
1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු.........................................................................06
1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන...................................................................................06
1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු...........................................................................09

**02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම**...............................................................................10

**03. පරිච්ඡේදය - 2022 වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය**......................................................... .13
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය................................................................................................13
3.2 මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශය.............................................................................................13
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය..................................................................................................13
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්............................................................................................................13
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය.......................................................................................13
3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය....................................................13
3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස
මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද
ප්‍රතිපාදන.................................................................................................................... ........14
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය..................................................................14
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව **.......................................................................................14

**04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක**.......................................................................................15
4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව)...........................................15

**05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**................................17
5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු......................................................................17
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග..................................................18

**06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ**....................................................................................21
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය..............................................................................................21
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපාන අයුරු............22
6.3 මානව සම්පත් සංවර්ධනය......................................................................................................22

**07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව**.........................................................................................23

**01 පරිච්ඡේදය**

## 1.1 හැඳින්වීම

ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් ගුණාත්මක, විශ්වාසදායී, ආපදාවන්ට ඔරොත්තු දෙන, කාර්යක්ෂම, ඵලදායී ප්‍රවාහන සේවාවක් ගොඩනැංවීම වර්තමානය වන විට අතවශ්‍ය සාධකයක් වී ඇත. මෙහිලා ප්‍රවාහන අමාත්‍යාංශය විසින් ප්‍රවාහන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම, නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂනය යොදා ගනිමින් සියලු ක්‍රමවේදයන් ප්‍රතිසංස්කරණය කිරීමේ කර්තව්‍යයේ නියැලෙමින් සිටී. ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය හා යටතේ පවතින ආයතන සියල්ලද දායක කරගනිමින් 2022 වසර තුළ ද ව්‍යාපෘති හා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදි.

මහජන සුභ සිද්ධිය හා පොදු මගී අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රවාහන පද්ධතියේ සංවර්ධනයක් නිරතුරුවම සිදු විය යුතුය. ශ්‍රී ලංකාව තුළ වරින් වර ඇතිවූ විවිධ අර්බුද හමුවේ පොදු ප්‍රවාහන ක්ෂේත්‍රය සීඝ්‍ර ලෙස බිඳ වැටීමකට ලක්විය. එවන් තත්ත්වයන් මත මගී ජනතාව පොදු ප්‍රවාහනයෙන් ඈත් වී පුද්ගලික ප්‍රවාහන මාධ්‍ය කරා යොමුවීමට නැඹුරු විය. ඉන්ධන හිඟය මත පොදු ප්‍රවාහන සේවා අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා ගැටලුකාරී තත්ත්වයන් පැවති කාලය තුළ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ලබා දුන් සේවය ප්‍රශස්ත විය. 2022 වර්ෂයේදී ජාතික ප්‍රවාහන පද්ධතිය තුළ මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු අඛන්ඩව සිදු කරමින් ශ්‍රී ලංකා දුම්රිය සේවය ජාතික ප්‍රවාහන පද්ධතියට ප්‍රධාන සැපයුම්කරුවෙක් ලෙස දායකත්වය ලබාදෙමින් සතුටුදායක මෙහෙවරක නියැලුණි. දුම්රිය සේවාව කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා දුම්රිය ඇණියේ සුළු අළුත්වැඩියා, දුම්රිය මාර්ගයේ හා සංඥා පද්ධතියේ නඩත්තු හා අළුත්වැඩියා කටයුතු අඛණ්ඩව සිදු කිරීමට පියවරගන්නා ලදි. මගී පහසුව හා ආරක්ෂාව සඳහා දුම්රිය වේදිකා ඉස්සීම හා දීර්ඝ කිරීමේ කටයුතුද සිදු කරන ලදි. කොවිඩ්- 19 වසංගත තත්ත්වයෙන් පසු 2022 වසර තුළ දුම්රිය ප්‍රවාහන කටයුතු සාමාන්‍ය තත්ත්වයට පත්වීම මෙන්ම දුම්රිය ගාස්තු වැඩිවීමට සාපේක්ෂව අනෙකුත් ප්‍රවාහන සේවා ගාස්තු ඉහළ යාම හේතුවෙන් දුම්රිය කෙරෙහි මගී ආකර්ෂණය වැඩිවීම දුම්රිය ආදායම වැඩිවීමට බලපෑ ප්‍රධානතම හේතුව වේ. ඉන්ධන මිල ඉහළ යාම හේතුවෙන් භාණ්ඩ ප්‍රවාහනය සඳහාද ජනතාව විශාල ලෙස දුම්රිය වෙත නැඹුරු වී ඇති අතර, දුම්රියෙන් සිදු කරන භාණ්ඩ ප්‍රවාහන කටයුතුවල සැලකිය යුතු ඉහළ යාමක් දැකිය හැක.

විද්‍යාත්මකව තීරණය කරනු ලබන පොදු කාලසටහනක් මත ඇත්ත වශයෙන් වූ මගී ඉල්ලුම සපුරා ගැනීම සඳහා ප්‍රවීන රාජ්‍ය බස් සේවයක් හෝ පෞද්ගලික බස් සේවයක් ලබාදීම අරමුණු කර ගනිමින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ හා පෞද්ගලික බස්රථ සඳහා පොදු කාලසටහන් සකස් කරනු ලැබේ. 2022 වර්ෂයේදී විශේෂ අවධානය යොමු වූ ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදි. ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘති, Google තාක්ෂණය ඔස්සේ පොදු ප්‍රවාහන සේවා හඳුන්වා දීම (GTFS), මාර්ගගත ක්‍රමයෙන් බස්රථ වල ආසන වෙන්කිරීමේ ව්‍යාපෘති, බස්රථ සඳහා GPS සිම්පත් නිකුත් කිරීම, My Bus-SL යෙදුම හරහා GPS සවිකර ඇති බස්රථ පිළිබඳ සජීවී තොරතුරු බස් මගීන්ට බලා ගැනීමට හැකියාව ලබාදීම, පෙරගෙවුම් කාඩ්පත් නිකුත් කිරීමේ නියමු ව්‍යාපෘතිය ගාල්ල මාකුඹුර අධිවේගී මාර්ගයේ පෞද්ගලික බස්රථ වල ක්‍රියාත්මක කරන ලදි. මේවන විට Backend මෘදුකාංගය සමග ඒකාබද්ධ ඕනෑම ආකාරයේ ගෙවීම් මාදිලියකට අවස්ථාව සලසා ඇත.

බස්රථ ඇණියේ වර්ධනය හා බස්රථ පුනරුත්තාපනය සඳහා 2022 වර්ෂය අවසන් වන විට අයැවය ප්‍රතිපාදන මඟින් රුපියල් මිලියන 1000ක මුදලක් භාණ්ඩාගාරය විසින් වෙන්කර තිබූ අතර එම වර්ෂය තුළ රුපියල් මිලියන 711.09ක මුදලක් වැය කර ඇත. ජාතික පෙරගෙවුම් ප්‍රවාහන කාඩ්පත් ව්‍යාපෘතිය සඳහා

Backend පද්ධති සංවර්ධනය කිරීමට 2022 ජුනි මසදී ගිවිසුම් ගතවී ඇත. ඊට අදාළ නියමු ව්‍යාපෘතිය මාකුඹුර ගාල්ල අතර සිදු කිරීමට යෝජනා විය. Backend application සඳහා රුපියල් මිලියන 1.5 ගෙවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ඉලෙක්ට්‍රොනික් කාඩ්පත් මඟින් ගෙවීම් කිරීමේ පහසුකම ලබාදීම හා අංක තහඩු බෙදා හැරීමට සීඝ්‍රගාමී කුරියර් ක්‍රමවේදය හඳුන්වා දීම මෙම දෙපාර්තමේන්තුව ලඟා කරගත් ප්‍රධාන ඉලක්කයන් වේ.

මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් රාශියකි. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දුන් 2011-2021 දශකය සමාලෝචනය කිරීම හා 2021-2030 නව මාර්ග ආරක්ෂණ දශකයට සමගාමීව සැලැස්මක් සකස් කිරීම, මාර්ග අනතුරු අවම කිරීම පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, මාර්ග රිය අනතුරු දත්ත කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම, ග්‍රාමීය මාර්ග ආශ්‍රිතව සිදුවන මාර්ග රිය අනතුරු ඉහළ යාම පාලනය කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ව්‍යුහයක් සකස් කිරීම, පළාත් මාර්ග ආරක්ෂණ ඒකක හරහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, වන ජීවීන් මාරුවන ස්ථානයන්හි රියදුරන් දැනුවත් කිරීමේ පුවරු ස්ථාපිත කිරීමේ වැඩසටහන, දුම්රිය හරස් මාර්ග, දුම්රිය ස්ථාන හා දුම්රිය මාර්ග ආශ්‍රිතව දැනුවත් කිරීමේ පුවරු ස්ථාපිත කිරීමේ වැඩ සටහන, රියඅනතුරු බහුල ප්‍රදේශයන්වල දැනුවත් කිරීමේ පුවරු ස්ථාපිත කිරීම, පාසල් මාර්ග ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම, මාර්ග ආරක්ෂාව පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම යනාදිය වේ.

2022 වර්ෂයෙහි රටෙහි පැවති අර්බුදකාරී තත්ත්වයන් මත වුවද ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය වෛද්‍ය පරීක්ෂණ 558,032 ක් සිදු කර ඇත. සීමාසහිත ලක්දිව ඉංජිනේරු පුද්ගලික ආයතනයේ විසින් නව ව්‍යාපෘතියක් ලෙස රජයට අයත් වාහන සඳහා සේවා සැපයීම්ද සිදු කරනු ලබයි.

ප්‍රවාහන අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින සියළුම ආයතන එක්ව කටයුතු කරමින් කාර්යක්ෂම හා පරිසර හිතකාමී පොදු ප්‍රවාහන පද්ධතියක් සඳහා 2022 වසර තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හා වැඩසටහන් පිළිබඳ මතු පෙළ ගැස්වේ.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

**දැක්ම**

ශ්‍රී ලංකාව, කලාපය තුළ ප්‍රමුඛතම මහජන කේන්ද්‍රීය ප්‍රවාහන පද්ධතිය සහිත රට බවට පත් කිරීම.

**මෙහෙවර**

ජනතාවගේ ජීවන තත්ත්වයන් නගා සිටුවීම උදෙසා නවයතම තාක්ෂණික ක්‍රමෝපායන් භාවිතා කරමින් ඉතා උසස් ප්‍රවාහන යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය සහ තිරසරව පවත්වාගෙන යාම.

**අරමුණු**

- මගීන්, භාණ්ඩ ප්‍රවාහනය කිරීම සහ සංචාරක ප්‍රවාහන පහසුකම් සැපයීම.
- මහජන විශ්වාසය දිනා ගනිමින් රථවාහන තදබදය සහ මාර්ග අනතුරු වළක්වා ගැනීම සඳහා කාලසටහනකට අනුව ප්‍රවාහන සේවා පවත්වාගෙන යාම.
- ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම.
- මහාමාර්ග හා දුම්රිය මාර්ගවලට සම්බන්ධ පරිසර හිතකාමී සහ මගී හිතකාමී ප්‍රවාහන පද්ධතියක් ස්ථාපිත කිරීම.
- 1991 අංක 37 දරණ ජාතික ප්‍රවාහන කොමිෂන් පනත ක්‍රියාවට නැංවීම
- 1950 අංක 18 දරණ දුම්රිය පනත ක්‍රියාත්මක කිරීම.
- 2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත ක්‍රියාවට නැංවීම
- 1997 අංක 25 දරණ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත ක්‍රියාවට නැංවීම
- 1951 අංක 14 දරණ මෝටර් රථ ප්‍රවාහන පනත ක්‍රියාවට නැංවීම
- වෙනත් අමාත්‍යාංශයකට පවරා නොමැති ප්‍රවාහන විෂය පවරා ඇති අමාත්‍යාංශ හා ඊට අනුබද්ධිත ආයතනයන් වෙත පවරා ඇති විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් ක්‍රියාවට නැංවීම.

## 1.3 ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන්

අංක 2289/43 හා 2022.07.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා පහත කාර්යයන් හා කර්තව්‍යයන් පවරා ඇත.

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ප්‍රවාහන විෂයට සහ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති හා වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත් වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යයභාරයය ඉටුකිරීමට සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන තාක්ෂණය යොදාගනිමින් සියළු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.

- වාහන තදබදය අවම කිරීම සඳහා වාහන අංගන පිහිටුවීම.
- මගී තොටුපල සේවාවන් සැපයීම.
- ආරක්ෂාකාරී සහ විශ්වාසනීය මගී ප්‍රවාහන සේවාවක් සැපයීම.
- පරිසර හිතකාමී ප්‍රවාහන සේවා පද්ධතියක් හඳුන්වාදීම.
- පුද්ගලික ප්‍රවාහන සේවාවන් නියාමනය කිරීම.
- බස්රථ නිශ්පාදනය හා ප්‍රවාහන ක්ෂෙත්‍රයන්ට අදාළ දේශීය කර්මාන්ත පද්ධතියක් ගොඩනැඟීම.
- නව දුම්රිය මාර්ග ඉදිකිරීම, පුළුල් කිරීම සහ ඊට අදාළව ඉඩම් පවරා ගැනීම සහ යටිතල පහසුකම් සංවර්ධනය ඇතුළු සියළු කටයුතු.
- වරායන් වෙත දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපනය කිරීම සහ පුළුල් කිරීම.
- මෝටර්ර ථ වාහන ලියාපදිංචිය හා බලපත්‍ර නිකුත් කිරීම.
- රියදුරු බලපත්‍ර නිකුත් කිරීම.
- මෝටර් රථ වාහන වලට අදාළ නීතිරීති සහ මාර්ගෝපදේශ  නිකුත් කිරීම සහ නියාමනය කිරීම.
- හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා ප්‍රවාහන ක්ෂෙත්‍රයේ දායකත්වය උදෙසා උපායමාර්ග වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතන වලට පැවරී ඇති අනෙකුත් විෂයයන්ට අදාළ සියලු කටයුතු කිරීම.
- අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතන අධීක්ෂණය කිරීම.

## 1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන

1.4.1 සෙත්සිරිපාය පරිශ්‍රය - පිටු අංක 07
1.4.2 මරදාන පරිශ්‍රය - පිටු අංක 08

## 1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු


- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

## 1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන


- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
- ජාතික ගමනාගමන කොමිෂන් සභාව
- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය
- මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
- ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම

## 1.4 ප්‍රවාහන අමාත්‍යාංශයේ සංවිධාන සටහන

### 1.4.1 සෙත්සිරිපාය පරිශ්‍රය



1.4.2 මරදාන පරිශ්‍රය



## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | මූල්‍ය ප්‍රභවය | | ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම (රු.මි.) | සමුච්චිත වියදම (රු. මි.) (2022.12.31 දිනට) | කාල සීමාව | සාරාංශගත ව්‍යාපෘති ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|
| | දේශීය/ විදේශීය | ආයතනය | | | | % | විස්තර |
| මහ කොළඹ නාගරික ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති | දේ<br>වි | (JBIC)<br>ශ්‍රී ලංකා රජය | 4,980.0 | 4729.72 | 2009-2013- අදියර 1<br>2013-2023 - අදියර 2<br>- | 97% | නාගරික සැලසුම් සකස් කිරීම<br>බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන සැලසුම් කිරීම<br>යටිතල පහසුකම් සංවර්ධනය |
| ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම (TPPF) | වි<br>දේ | ADB<br>ශ්‍රී ලංකා රජය | 1,456.50<br>9,798.08 | 4,836.10 | 2016-2023 | | ව්‍යාපෘතියට අදාළ නිමැවුම් 2021.04.30 දිනට අවසන් කර ඇත. |
| දුම්රිය රක්ෂිතයේ අනවසර පදිංචිකරුවන් නැවත පදිංචි කිරීම | දේ | ලංකා රජය | 9600.00 | 3181.45 | 2016-2025 | 33.14% | |
| දුම්රිය කාර්යක්ෂමතාව නැංවීමේ ව්‍යාපෘතිය (REIP) | වි<br>දේ | ADB<br>ශ්‍රී ලංකා රජය | 28,232.00<br>5,646.40 | 5005.64<br>230.52 | 2019- 2025 | 17.73%<br>4.08% | |
| මහව-ඕමන්ත දුම්රිය ව්‍යාපෘතිය | වි | ඉන්දියානු ණය ආධාර | 91.26 | 12,639.4 | වසර 3ක් | 40%<br>53% | භෞතික<br>මූල්‍ය |
| ලෝක බැංකු ණය ආධාර යටතේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | වි | ලෝක බැංකුව | 459.7 | 212.4 | වසර 2ක් | 99% | දුම්රිය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කල ව්‍යාපෘතිය නිමකර ඇති අතර, ශ්‍රී ලංගම විසින් නිමකර ඇති ප්‍රගතිය 95%කි. ඉතිරි වැඩ කටයුතු ආයතනික ප්‍රතිපාදන මගින් සිදුකරයි. |

**දේ- දේශීය    වි- විදේශීය**

## 02 පරිච්ඡේදය

**ඵලදායී හා කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක කරා පියනගමු.......**

ප්‍රවාහනය යනු රටේ ආර්ථිකයට සෘජු බලපෑමක් ඇති කරන එක් වැදගත් සේවාවකි. විධිමත් ප්‍රවාහන පද්ධතියක් ගොඩනැංවීම තුළින් රටක සංවර්ධන ඉලක්කයන් කරා ළඟාවීමේදී මහාමාර්ග හා දුම්රිය මාර්ග පද්ධතිය ඇතුළු යටිතල පහසුකම් පුළුල් කිරීම, සුවපහසු හා කාර්යක්ෂම මගී ප්‍රවාහනය, පරිසර බලපෑම්, මාර්ග තදබදය වැනි සාධක පිළිබඳ අවධානය යොමුකල යුතුය. මගී ජනතාවගේ සහ කර්මාන්ත හා සේවා අංශයන්හි අවශ්‍යතාවන් ආමන්ත්‍රණය වන පරිදි ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීමත් ඒ තුළින් රටේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා දායකවීමත් ප්‍රවාහන අමාත්‍යාංශයේ වගකීම වේ. ඒ සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමත් ඒවා ක්‍රියාත්මක කරවීම, අධීක්ෂණය, ඇගයීම හා පසුවිපරම් කිරීම ප්‍රවාහන අමාත්‍යාංශය මඟින් සිදු කෙරේ.

2022 වසරේ මුල් භාගයේ ශ්‍රී ලාංකික ජනතාව මුහුණ දුන් ප්‍රධානම අර්බුදයන් අතර ඉන්ධන හිඟය, ඉන්ධන මිල අනපේක්ෂිත ලෙස ඉහළ යාම දැක්විය හැක. මේ හේතුවෙන් පුද්ගලික වාහන පමණක් නොව විකල්ප ප්‍රවාහන ක්‍රමවේදයන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ද දැඩි බලපෑමක් එල්ල වූ අතර මෙහිදී විවිධ සීමාවන් යටතේ පොදු ප්‍රවාහන සේවා ජනතා අවශ්‍යතා සපුරාලීම සඳහා පවත්වාගෙන යන ලදී. එම නිසා ජනතාව විශාල වශයෙන් තම සංචලන අවශ්‍යතා සපුරාගැනීම සඳහා පොදු ප්‍රවාහන සේවා වෙත යොමු විය.

ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් ගුණාත්මක, විශ්වාසදායී, ආපදාවන්ට ඔරොත්තු දෙන ප්‍රවාහන සේවාවක් ගොඩනැංවීමේදී දුම්රිය දෙපාර්තමේන්තුවට විශාල කාර්යභාරයක් පැවරේ. දැනට පවතින දුම්රිය මාර්ග ජාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති, මහව සිට ඕමන්තෙයි දක්වා දුම්රිය මාර්ගය පුනරුත්තාපනය කිරීමේ ව්‍යාපෘතිය සහ මහ කොළඹ තදාසන්න දුම්රිය මාර්ග ව්‍යාපෘතිය, ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ දුම්රිය ඇණිය ශක්තිමත් කිරීම සඳහා නව දුම්රිය කට්ටල මිලදී ගැනීම, දේශීය අරමුදල් මගින් මගී මැදිරි පුනරුත්ථාපනය කිරීම සහ දුම්රිය ඇණියේ අඛණ්ඩ නඩත්තු හා අලුත්වැඩියා කටයුතු ද සිදු කිරීම, බස්රථ මගින් සපයනු ලබන මගී ප්‍රවාහන සේවාවේ කාර්යක්ෂමතාවය වැඩිකිරීම සඳහා ඉන්දියානු ණය ආධාර යටතේ බස්රථ 200ක් ආනයනය කර සේවාවේ යෙදවීම, මගී පහසුව සහ ආරක්ෂාව සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් දුම්රිය තුළට ප්‍රවේශවීම සහ පිටවීම පහසු කරලීම සඳහා දුම්රිය වේදිකා ඉස්සීම සහ දීර්ඝ කිරීමේ කටයුතු සිදු කිරීම සහ විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සඳහා ප්‍රවේශ පහසුකම් පුළුල් කිරීම ආදිය සිදුකෙරේ.

ශ්‍රී ලාංකීක ජනතාවට ආරක්ෂිත, සුවපහසු, විශ්වාසදායි මගී ප්‍රවාහන සේවයක් සාධාරණ ගාස්තු ක්‍රමයක් යටතේ පිරිනමමින් රාජ්‍ය අංශයේ දායකත්වය ලබමින් නැගී සිටින ජනතා හිතෛෂී ආයතනයක් ලෙස ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හැඳින්විය හැකිය. මෙම ආයතනය මඟින් ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි තම සේවා දියත් කරමින් ජනතාව සඳහා සේවාවන් රැසක් ලබා දේ. ශ්‍රීලංගම හා දුම්රිය ඒකාබද්ධ සේවය වඩාත් විධිමත් කරමින් ව්‍යාප්ත කිරීම, දුරකථන ඇමතුම් මගින් බස්රථවල ආසන වෙන් කර ගැනීමේ පහසුකම ඇතිකිරීම, වාර ප්‍රවේශ පත්‍ර සේවා, සමාන්තර මගී සේවා, හදිසි බිඳ වැටීම් වලදී ශ්‍රීලංගම සේවා, මහරගම අපේක්ෂා රෝහල වෙත විශේෂ බස් රථ සේවාවක් ආරම්භ කිරීම, "බස් පුස්තකාල" ව්‍යාපෘතිය, “Park & Ride” ව්‍යාපෘතිය යනාදිය ශ්‍රීලංගමය මඟින් ලබාදෙන ප්‍රධාන සේවාවන් වේ. ලෝක බැංකු ආධාර යටතේ දුම්රිය ස්ථානවල සහ බස් ඩිපෝවල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතියක් (CERC ව්‍යාපෘතිය) ක්‍රියාත්මක කර ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රවාහන මාධ්‍යයන් නියාමනය කිරීම සහ බස්රථ මගින් මගී ප්‍රවාහනය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව රජයට උපදෙස් දීම සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිස 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව පිහිටුවා ඇත. ජාතික

ගමනාගමන කොමිෂන් සභා පනත මගින් පැවරී ඇති බලතල හා කර්තව්‍යයන්ට අනුකූලව ශ්‍රී ලාංකික ජනතාවට කාර්යක්ෂම, ඉහල ප්‍රමිතියකින් යුත් පරිසර හිතකාමී, සුවපහසු ප්‍රවාහන සේවාවක් ලබාදීම සහ ප්‍රවාහනයට නූතන ප්‍රවේශයක් ඇති කිරීම සඳහා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

පහසුකම් අවම ප්‍රදේශවල ජනතාවගේ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් සමාජ සුභසාධන බස් සේවාලෙස “සිසු සැරිය” සහ “නිසි සැරිය” සේවා ක්‍රියාත්මක වේ. නව “සිසු සැරිය” සේවා 52ක්, නව “නිසි සැරිය” සේවා 25ක් 2022 වසරේ දී ආරම්භ කරන ලදි. සිසුසැරිය මඟින් පාසල් සිසුන්ට ආරක්ෂිත සහ විශ්වාසනීය පොදු ප්‍රවාහන සේවාවක් ලබාදෙන අතර ක්‍රියාත්මක වන සමස්ථ සිසුසැරිය සේවා සංඛ්‍යාව 1,617 කි. නිසි සැරිය සේවාව, රාත්‍රී හා අලුයම කාලයේ මගී ජනතාවගේ ප්‍රවාහන පහසුකම් සපුරාලීම සඳහා ක්‍රියාත්මක වන අතර ක්‍රියාත්මක සමස්ථ නිසි සැරිය සේවා සංඛ්‍යාව 216 කි. කිසිදු බස්රථ සේවාවක් ක්‍රියාත්මක නොවන, සමාජයීය වශයෙන් බස්රථ සේවාවක් අවශ්‍ය වුවද ආර්ථිකමය ලාභ නොලබන මාර්ග බැවින් මගී ප්‍රවාහනය සඳහා ධාවකයින් ඉදිරිපත් නොවන ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන ජනතාවට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා "ගැමි සැරිය” බස් රථ සේවාව ක්‍රියාත්මක වන අතර ක්‍රියාත්මක සමස්ථ සේවා සංඛ්‍යාව 13 කි.

පර්යේෂණ ප්‍රතිඵල පාදක කර ගත් නවීන තාක්ෂණය මෙරටට උචිත පරිදි පොදු ප්‍රවාහනයේ උන්නතිය උදෙසා යොදා ගත යුතුය. ප්‍රවාහන ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ දැනුම ප්‍රවාහන ක්ෂේත්‍රයට ලබා දීම සඳහා පර්යේෂකයන් සහ පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධීකරණයක් හා සන්නිවේදනයක් ගොඩ නඟා ගැනීම මේ සඳහා ඉතා වැදගත් වේ. එහිදී පොදු ප්‍රවාහන සේවය සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීම යටතේ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණය කිරීම, Google (ගූගල්) තාක්ෂණය ඔස්සේ පොදු ප්‍රවාහන සේවා තොරතුරු ලබා දීම, MyBus-SL යෙදවුම හඳුන්වා දීම, බස් රථ සඳහා GPS සවි කිරීම හා මාර්ගගත ආසන වෙන් කිරීම යනාදී කටයුතු සිදු කර ඇත. තවද මෙම වසරේ දී මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය විසින් දක්ෂිණ අධිවේගී මාර්ගයේ ගමන් ගන්නා මාකුඹුර - ගාල්ල බස්රථ සඳහා පෙරගෙවුම් කාඩ්පත් ක්‍රමයක් හඳුන්වාදෙන ලදි.

ශ්‍රී ලංකාව තුළ මෝටර් වාහන ලියාපදිංචිය, නියාමනය, රියදුරු බලපත් නිකුත් කිරීම, මාර්ග ආරක්ෂාව හා පරිසර හිතකාමී වාහන භාවිතය යන අරමුණු පෙරදැරිව කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. සියලුම දිස්ත්‍රික් කාර්යාල මාර්ගගත (online) සම්බන්ධතාව මඟින් නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය සමඟ සම්බන්ධ වීමෙන්, ග්‍රාමීය/ප්‍රාදේශීය මට්ටමේ සේවාලාභීන්ගේ අවශ්‍යතා කඩිනමින් ඉටු කිරීමත්, නවීන පහසුකම් සහ නව තාක්ෂණය තුළින් සේවාලාභී අපේක්ෂාවන් වඩා පහසුකරලීමත් දෙපාර්තමේන්තුවේ ඉදිරි අභිලාෂයන් අතර ප්‍රධාන වේ. මෙම අමාත්‍යාංශය විසින්, සපයනු ලබන සේවාවන් සඳහා ඉලෙක්ට්‍රොනික් කාඩ්පත් මඟින් ගෙවීම් කිරීමේ පහසුකම ලබා දීම, අංක තහඩු බෙදා හැරීමට සීඝ්‍රගාමී භාණ්ඩ බෙදාහැරීමේ (කූරියර්) ක්‍රමවේදයක් හඳුන්වා දීම යනාදි ඉලක්ක සපුරාගෙන ඇත. 2022 වර්ෂයේ මුද්‍රණය කර ඇති රියදුරු බලපත්‍ර ප්‍රමාණය 125,250 කි. ලියාපදිංචි නව වාහන සංඛ්‍යාව 20,510 ක් වන අතර වාහන පැවරුම් සංඛ්‍යාව 612, 877 කි.

“සැමට සුරක්ෂිත මාර්ග පද්ධතියක්” යන දැක්ම මුල් කරගනිමින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව පිහිටුවා ඇත. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව, “ජාතික ප්‍රවාහන සුරක්ෂාව පිළිබඳ කොමිෂන් සභාව” ලෙස ස්ථාපිත කිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඊට අදාළ පනත් කෙටුම් පත සකස්කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමුකර ඇත. එමෙන්ම 2021 - 2025 කාල සීමාව සඳහා මාර්ග අනතුරු අවම කිරීම සඳහා අදාළ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර අවසන් කර ඇත. රුපියල් මිලියන 150 ක වටිනාකමකින් යුතු ලේසර් වේගමාපක, අඳුරු වීදුරු පරීක්ෂා කිරීමේ ලුමිනස් මීටර්, ශබ්දය පරීක්ෂා කිරීමේ මීටර් යනාදී තාක්ෂණික උපකරණ ශ්‍රී ලංකා රථවාහන පොලිසියට ලබා දීමට කටයුතුකර ඇත. එමෙන්ම මත්ද්‍රව්‍ය භාවිතා කර රිය ධාවනය කරන

රියදුරන් හඳුනා ගැනීමේ උපකරණ කට්ටල මිල දී ගැනීමට අවශ්‍ය රුපියල් මිලියන 10ක් ශ්‍රී ලංකා පොලීසියට ලබා දී ඇත.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හා පුද්ගලික බස් හිමියන්ගේ අබලන් වන මගී බස් රථ සහනදායී මිලකට උසස් තත්ත්වයෙන් අලුත්වැඩියා කොට ධාවනයට එක් කිරීම සඳහා ලක්දිව ඉංජිනේරු සමාගම පිහිටුවා ඇත. 2001 වර්ෂයේ සිට 2021 වර්ෂය තෙක් ශ්‍රීලංගම බස් රථවල බස් බොඩි අලුත්වැඩියාව පමණක් සිදුකළ මෙම ආයතනය 2021 වර්ෂයේදී රජයට අයත් සියළු වාහනවල අලුත්වැඩියාවන් හා සේවා සැපයීම් සිදු කිරීම සඳහා නවීන යන්ත්‍රෝපකරණ වලින් සමන්විත වාහන සේවා මධ්‍යස්ථානයක් ආරම්භ කරන ලදි.

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලය සහ දිවයින පුරා පිහිටි දිස්ත්‍රික් කාර්යාල 25 කින් සමන්විත වේ. සියලුම රියදුරු බලපත්‍ර අපේක්ෂකයන්ට ගුණාත්මක වෛද්‍ය පරීක්ෂණ සිදුකර ශාරීරික හා මානසික යෝග්‍යතාවය පිළිබඳ සහතික කිරීම මෙම ආයතනයේ ප්‍රධාන කාර්යභාරයයි. 2022 අගෝස්තු වන විට වෛද්‍ය පරීක්ෂණ 558,032ක ප්‍රමාණයක් සිදුකර ඇත.

එමෙන්ම යාවත්කාලීන වූ ජාතික ගොඩබිම් ප්‍රවාහන ප්‍රතිපත්තියක අවශ්‍යතාව මෙම වසර තුළ තදින්ම පෙන්නුම් විය. අර්බුදකාරී අවස්ථාවන්හි ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ කාලානුරූපී නිගමනයන්ට එළඹීමට ප්‍රවාහන ප්‍රතිපත්තියක ඇති අවශ්‍යතාව මැනවින් පිළිඹිබු විය. එබැවින් මගී හා භාණ්ඩ ප්‍රවාහනයේ සියළු මානයන් ආමන්ත්‍රණය වන පරිදි පවතින ප්‍රවාහන ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමේ වැඩකටයුතු 2022 වසරේදී ආරම්භ කරන ලදී.

ජනතාව වැඩි වශයෙන් පොදු ප්‍රවාහන සේවාව වෙත ආකර්ෂණය කර ගැනීම මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති ප්‍රධාන අභියෝගයක් වන අතර, එයට සාර්ථකව මුහුණ දීමට හැකි වන්නේ ජනතා හිතවාදී, සුවපහසු, කාර්යක්ෂම සහ නිසි වෙලාවට ධාවනය වන ප්‍රවාහන සේවාවක් ක්‍රියාත්මක කිරීම තුළිනි. එබැවින් ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාලව පිහිටුවා ඇති මෙම සියලු ආයතන සම්බන්ධීකරණය ද ඒවායේ කටයුතු සඳහා මාර්ගෝපදේශනය ද එම කටයුතු අධීක්ෂණය ද සිදුකරමින් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ශ්‍රී ලාංකික ප්‍රවාහන ක්ෂේත්‍රයේ නියමුවා ලෙස ක්‍රියාකරයි.

**එම්. එම්. පී. කේ. මායාදුන්නෙ**
ලේකම්
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

## 03 පරිච්ඡේදය

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍යකාර්ය සාධනය

**3.1** මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

**3.2** මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**3.3** මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

***ඉහත දැක්වෙන ප්‍රකාශ සම්බන්ධයෙන් අදාළ තොරතුරු ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය විසින් ඇතුළත් කරනු ලබයි.**

**3.4** මූල්‍ය ප්‍රකාශ සටහන්

-

**3.5** ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව (රු.මි.) | අවසන් ඇස්තමේන්තුව (රු.මි.) | ප්‍රමාණය (රු.මි.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 20.03.99.00 | වෙනත් ලැබීම් | 43.75 | 43.75 | 24.21 | 55.34 |
| 20.02.02.99 | ර.නි.අ.බ්. පොළි | 1.42 | 1.29 | 1.09 | 84.50 |
| 20.03.03.02 | දඩ සහ රාජසන්තක කිරීම් | 1.00 | 1.00 | 0.06 | 6.00 |
| 20.02.01.01 | ගෙවල් කුලී | 1.42 | 1.29 | 0.11 | 8.53 |
| 20.06.02.02 | ප්‍රාග්ධන වත්කම් විකිණීම (වෙනත්) | 0.51 | 0.36 | 0.48 | 133.34 |

**3.6** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු) | | තත්‍ය වියදම (රු) | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 10,726,020,000 | 10,726,020,000 | 9,914,581,902.21 | 92.43 |
| ප්‍රාග්ධන | 3,935,500,000 | 3,935,500,000 | 3,867,411,276.82 | 98.27 |

**3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන (රු) | | සත්‍ය වියදම රුපියල් (රු) | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | කුරුණෑගල දි/ලේ | කුරුණෑගල-හබරණ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කරගැනීම පරිපාලන වියදම් දැරීම සඳහා | 3,250,000 | 3,250,000 | 3,250,000 | 100 |
| 02 | අනුරාධපුර දි/ලේ | | 450,000 | 450,000 | 449,947.55 | 100 |
| 03 | පොලොන්නරුව දි/ලේ | | 350,000 | 350,000 | 350,000 | 100 |
| 04 | මාතලේ දි/ලේ | | 2,000,000 | 2,000,000 | 1,846,599.13 | 92 |

**3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැඟිලි හා ව්‍යුහයන් | | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | | | |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

මේ සඳහා අවසාන වාර්තාව මහාමාර්ග අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කරනු ලබයි. එතෙක් ප්‍රවාහන අංශයට අදාළ දත්ත ඉදිරිපත් කර ඇත.

**3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව ****

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව - **ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය විසින් ඉදිරිපත් කරනු ලබයි.**

## 04 පරිච්ඡේදය
## කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100 - 90% | 89- 75% | 74 - 50% | 49 - 0% |
| **දුම්රිය ප්‍රවාහනය** | | | | |
| ➢ භාණ්ඩ ප්‍රවාහන දුම්රිය සංඛ්‍යාව | ✓ | | | |
| ➢ දිනකට ක්‍රියාත්මක වන දුම්රිය සංඛ්‍යාව | ✓ | | | |
| ➢ ඉදිකළ දුම්රිය මාර්ග (දිග කි.මී) | ✓ | | | |
| **බස් රථ ප්‍රවාහනය** | | | | |
| ➢ ක්‍රියාත්මක කරන ලද නව සිසුසැරිය බස්රථ සේවා සංඛ්‍යාව | | | ✓ | |
| ➢ ක්‍රියාත්මක කරන ලද නව නිසිසැරිය බස්රථ සේවා සංඛ්‍යාව | | | | ✓ |
| ➢ නව තාක්ෂණය පදනම් කරගත් සේවා සංඛ්‍යාව | | | | ✓ |
| ➢ වසරකට පුහුණු කරනලද බස්රථ කාර්යය මණ්ඩල සංඛ්‍යාව | | ✓ | | |
| ➢ ක්‍රියාත්මක කරනලද ඒකාබද්ධ සහ ඒකාබද්ධ නොවන කාලසටහන් සංඛ්‍යාව | | | ✓ | |
| ➢ සවිකරන ලද සංඥා පුවරු සංඛ්‍යාව | | | | ✓ |
| ➢ ප්‍රවාහනයට සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් | | | ✓ | |
| ➢ ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛන වාර්තා සකස්කිරීම | ✓ | | | |
| ➢ මහජන පැමිණිලි සම්බන්ධයෙන් පවත්වන ලද පරීක්ෂණ සංඛ්‍යාව | | ✓ | | |
| **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව** | | | | |
| ➢ භෞතික සම්පත් සංවර්ධනය යටතේ ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය | ✓ | | | |
| ➢ ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම යටතේ දෘඩාංග හා මෘදුකාංග අත්පත් කරගැනීමේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය | ✓ | | | |
| ➢ මානව සම්පත් සංවර්ධනය සඳහා සිදුකර ඇති වැඩසටහන් ගණන හා එහි මූල්‍ය ප්‍රගතිය | ✓ | | | |
| ➢ මූලධන ආයෝජනය යටතේ රියදුරු බලපත්‍ර නිකුත් කර ඇති ප්‍රමාණය සහ ඒ සඳහා කර ඇති වියදම | | | ✓ | |
| **මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව** | | | | |
| ➢ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව කොමිෂන් සභාවක් බවට පත්කිරීම | | | ✓ | |
| ➢ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වාදුන් 2011-2021 | | | | ✓ |

| | | | | |
|---|---|---|---|---|
| සමාලෝචනය හා 2021-2030 නව මාර්ග ආරක්ෂණ දශකයට සමගාමීව සැලැස්මක් සකස්කිරීම | | | | |
| ➢ යතුරුපැදි අනතුරු අවමකිරීම පිළිබඳ පර්යේෂණ කිරීම | | | ✓ | |
| ➢ ශ්‍රී ලංකාවේ සිදුවන පදික අනතුරු අවම කිරීම පිළිබඳ පර්යේෂණ කිරීම | | | | ✓ |
| ➢ මාර්ග රිය අනතුරු දත්ත කළමනාකරණ පද්ධතිය ස්ථාපිතකිරීම | | | | ✓ |
| ➢ මාර්ග ආරක්‍ෂාව පිළිබඳ විද්‍යුත් පුස්තකාලය යාවත්කාලීන කිරීම | ✓ | | | |
| ➢ ග්‍රාමීය මාර්ග ආශ්‍රිතව සිදුවන මාර්ග රිය අනතුරු ඉහළයාම පාලනය කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් හා ලේකම් කාර්යාල මට්ටමින් ව්‍යුහයක් සකස් කිරීම | | | | ✓ |
| ➢ මාර්ග ආරක්ෂණ ජාතික සතියට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ✓ | | | |
| ➢ පාසල් මාර්ග ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම | | ✓ | | |
| ➢ ආරක්ෂිත වාහන පද්ධතියක් ඇති කිරීමට මාර්ග ධාවන යෝග්‍යතා සහතික නිකුත් කිරීමේ වැඩසටහන් සඳහා සහාය ලබාදීම | | | ✓ | |
| ➢ අනතුරු බහුල පළාත් පාලන ආයතන වලට අයත් ග්‍රාමීය මාර්ග ආශ්‍රිතව රිය අනතුරු බහුල ස්ථානයන්හි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ✓ | | | |
| **අමාත්‍යාංශයේ කාර්ය සාධන දර්ශක** | | | | |
| ➢ පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව | ✓ | | | |
| ➢ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා ලබා දී ඇති පුහුණුවීම් සංඛ්‍යාව | ✓ | | | |
| ➢ පාර්ලිමේන්තුව වෙත වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීම | ✓ | | | |
| ➢ අමාත්‍යාංශය වෙත ලැබෙන භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් වැය කරන ලද ප්‍රතිශතය | | | ✓ | |
| ➢ වර්ෂය තුළ පවත්වා ඇති විගණන හා කළමනාකරණ කමිටු සංඛ්‍යාව | | ✓ | | |

# 05 පරිච්ඡේදය

# තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (2019 වසරට සාපේක්ෂව) | | |
|---|---|---|---|---|---|
| | | | 0 - 49% | 50 - 74% | 75 - 100% |
| නීරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම | 2030 වන විට මහා මාර්ගවල සිදු වන අනතුරුවලින් සිදු වන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව අඩු කිරීම | මරණ අනුපාතය | ✓ | | |
| නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | විශේෂයෙන්ම අවදානමට ලක් විය හැකි තත්ත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින් සහ වයස්ගත පුද්ගලයින්ට විශේෂ අවධානය යොමු කරමින් මහා මාර්ගවල ඉහළ නැංවීම, පොදු ප්‍රවාහන පද්ධති සැලකිය යුතු මට්ටමින් ව්‍යාප්ත කිරීම මගින් 2030 වන විට සියලුම දෙනාට ආරක්ෂාකාරී අඩු මිලට ලබා ගත හැකි ප්‍රවේශ විය හැකි සහ තිරසර ප්‍රවාහන පද්ධති ලබා දීම. | 1. භාණ්ඩ ප්‍රවාහන දුම්රිය වාර සංඛ්‍යාව | | | ✓ |
| | | 2. දිනකට ධාවනය කරන මගී දුම්රිය සංඛ්‍යාව | | | ✓ |
| | | 3. නව සිසුසැරිය හා නිසිසැරිය බස්රථ සේවා සංඛ්‍යාව | | ✓ | |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2015 වර්ෂයේදී පවත්වන ලද තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේදී සම්මත කරගත් 2030 න්‍යාය පත්‍රයට අනුකූල වෙමින් සමස්ත සංවර්ධනයට ඵලදායි ලෙස දායකත්වයක් සැපයීම අරමුණු කොට ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ශක්තිමත් ප්‍රවාහන සේවාවක් ඇති කිරීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශය පියවර රැසක් මේ වන විට දියත් කර ඇත. තිරසර සංවර්ධන අරමුණු තුළ ඉලක්ක කිහිපයක් සඳහා ප්‍රවාහන ක්ෂේත්‍රය සෘජු දායකත්වයක් දක්වන අතර අනෙකුත් ක්ෂේත්‍ර ගණනාවක ඉලක්ක සඳහා වක්‍ර දායකත්වයක් සපයයි. ඒ අනුව අරමුණු 3, 9 සහ 11 යටතේ ප්‍රවාහන ක්ෂේත්‍රයට සෘජු ලෙස අදාළ ඉලක්ක හඳුනාගත හැක.

**<u>3 වන තිරසාර සංවර්ධන අරමුණ</u>**

(3.6) 2030 වන විට මහාමාර්ගවල සිදුවන අනතුරුවලින් සිදුවන තුවාලවීම් සහ මරණ සංඛ්‍යාව අඩු කිරීම.

මාර්ග අනතුරුවලින් දෛනිකව මරණ 8ක් පමණ වාර්තාවන අතර, අනතුරුවලින් විශාල වශයෙන් මරණයට හෝ අබාධිත තත්ත්වයට පත්වන්නේ ශ්‍රම බලකායට අයත් වයස් කාණ්ඩවල පුද්ගලයන්ය. මෙය රටේ ආර්ථිකයට මෙන්ම සමාජයීය වශයෙන්ද ගැටලු ඇති කරයි.

එබැවින්, මාර්ග අනතුරු අවම කරගනිමින් තිරසාර සංවර්ධන අරමුණු යටතේ අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම ප්‍රමුඛත්වයක් ලෙස සලකා ප්‍රවාහන අමාත්‍යාංශය විසින් කටයුතු කරනු ලැබේ.

- ශ්‍රී ලංකාවේ සිදුවන පදික අනතුරු අවම කිරීම සම්බන්ධයෙන් පර්යේෂණ සිදුකිරීම
- පළාත් මාර්ග ආරක්ෂණ ඒකක හරහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ආරක්ෂිත වාහන පද්ධතියක් ඇතිකිරීම සඳහා මාර්ග ධාවන යෝග්‍යතා සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලියට සහාය ලබාදීම
- පාසල් මාර්ග ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- රිය අනතුරු බහුල (Blackspot) ස්ථාන පිළිබඳව, ජනාකීර්ණ ස්ථානවල දැනුවත් කිරීමේ පුවරු සවිකිරීම
- මාර්ග ආරක්ෂාව නියාමනය සහ කළමනාකරණය සඳහා ශ්‍රී ලංකා මාර්ග අනතුරු දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම
- ග්‍රාමීය මාර්ග ආශ්‍රිතව සිදුවන මාර්ග රිය අනතුරු ඉහළයාම පාලනය කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් හා ලේකම් කාර්යාල මට්ටමින් ව්‍යුහයක් සකස් කිරීම

**<u>9 වන තිරසාර සංවර්ධන අරමුණ</u>**

(9.1) ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

- දැනට පවතින දුම්රිය මාර්ග ජාලය වැඩිදියුණු කිරීම සඳහා වන ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම
- මහව සිට ඕමන්තෙයි දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සහ කොළඹ තදාසන්න දුම්රිය මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
- ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ දුම්රිය ඇණිය ශක්තිමත් කිරීම සඳහා නව දුම්රිය කට්ටල මිලදී ගැනීම,

- දේශීය අරමුදල් මගින් මගී මැදිරි පුනරුත්ථාපනය කිරීම සහ දුම්රිය ඇණියේ අඛණ්ඩ නඩත්තු හා අලුත්වැඩියා කටයුතු ද සිදු කිරීම.
- බස්රථ මගින් සපයනු ලබන මගී ප්‍රවාහන සේවාවේ කාර්යක්ෂමතාවය වැඩිකිරීම සඳහා ඉන්දියානු ණය ආධාර යටතේ බස්රථ 200ක් ආනයනය කර සේවාවේ යෙදවීම.
- මගී පහසුව සහ ආරක්ෂාව සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් දුම්රිය තුළට ප්‍රවේශ වීම සහ පිටවීම පහසු කරලීම සඳහා දුම්රිය වේදිකා ඉස්සීම සහ දීර්ඝ කිරීමේ කටයුතු සිදු කිරීම සහ විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා ප්‍රවේශ පහසුකම් පුළුල් කිරීම.
- මගී ප්‍රවාහන නියාමන ආයතනය වන ජාතික ගමනාගමන කොමිසමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීමේ ව්‍යාපෘතිය තුළින් මහජනතාවට ඉක්මන් සේවාවක් ලබාදීම.
- ලෝක බැංකු ආධාර යටතේ දුම්රිය ස්ථාන වල සහ බස් ඩිපෝවල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතියක් (CERC) ක්‍රියාත්මක කරන ලදී.
- 2022 වර්ෂයේදී මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය විසින් දක්ෂිණ අධිවේගී මාර්ගයේ ගමන් ගන්නා මාකුඹුර - ගාල්ල බස්රථ සඳහා පෙරගෙවුම් කාඩ්පත් ක්‍රමයක් හඳුන්වාදීම.
- දුරගමන් සේවා දුම්රිය හා බස් රථවල ආසන මාර්ගගතව වෙන් කිරීමේ වැඩපිළිවෙලක් දියත් කිරීම.

<u>11 වන තිරසාර සංවර්ධන අරමුණ</u>

(11.2) විශේෂයෙන්ම අවදානමට ලක් විය හැකි තත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින්, සහ වයස්ගත පුද්ගලයින්ට විශේෂ අවධානය යොමු කරමින් මහාමාර්ගවල ආරක්ෂාව ඉහළ නැංවීම, පොදු ප්‍රවාහන පද්ධති සැලකිය යුතු මට්ටමින් ව්‍යාප්ත කිරීම මගින් 2030 වන විට සියලුම දෙනාට ආරක්ෂාකාරී අඩු මිළට ලබා ගත හැකි ප්‍රවේශවිය හැකි සහ තිරසර ප්‍රවාහන පද්ධති ලබා දීම.

- පහසුකම් අවම ප්‍රදේශවල ජනතාවගේ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් සමාජ සුබසාධක බස් සේවාලෙස "සිසුසැරිය" ‘‘ගැමිසැරිය’’ සහ "නිසිසැරිය" සේවා සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කිරීම. ඒ අනුව සිසුසැරිය නව සේවා 52ක්, නිසි සැරිය නව සේවා 25ක් 2022 වසරේදී ආරම්භ කරනලදී. සිසුසැරිය මඟින් පාසල් සිසුන්ට ආරක්ෂිත සහ විශ්වාසනීය පොදු ප්‍රවාහන බස් රථ සේවාවක් ලබා දෙන අතර ක්‍රියාත්මක වන සමස්ත සිසුසැරිය සේවා සංඛ්‍යාව 1617කි.
- නිසිසැරිය සේවාව, රාත්‍රී හා අලුයම් කාලයේ මගී ජනතාවගේ ප්‍රවාහන පහසුකම් සපුරාලීම සඳහා ක්‍රියාත්මකවේ. මේ වනවිට ක්‍රියාත්මක පවතින සමස්ත නිසි සැරිය සේවා සංඛ්‍යාව 216 කි.
- ඉන්ධන අර්බුදයක් පැවති 2022 වසර තුළ පාසල් සේවා, කාර්යාලීය ප්‍රවාහන සේවා නිසි අයුරින් පවත්වාගෙන යාම සහ ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පෞද්ගලික ප්‍රවාහන විධි යොදා ගැනීම දුෂ්කර විය. එහිදී පොදු ප්‍රවාහන සේවාවන්හි අවශ්‍යතාව මනාව පැහැදිලි විය.
- ඉන්ධන අර්බුදයට පිළියමක් ලෙස මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ සහ කොළඹ කොටුව බැස්ටියන් මාවත බස් නැවතුම්පොළෙහි තාවකාලික ඉන්ධන බෙදාහැරීමේ මධ්‍යස්ථානයන් ස්ථාපිතකර මගී ජනතාවට අඛණ්ඩ සහ විශ්වසනීය පොදු මගී ප්‍රවාහන සේවාවක් ලබාදීමට කටයුතු කරන ලදී.
- ආබාධිත පුද්ගලයින්ට දුම්රියට ප්‍රවේශවීම අපහසු බැවින්, දුම්රිය වේදිකා ආබාධිත පුද්ගලයින්ට ප්‍රවේශවීමට පහසුවන පරිදි නවීකරණය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේ.
- ග්‍රාමීය මාර්ග ආශ්‍රිතව සිදුවන මාර්ග රිය අනතුරු ඉහළයාම පාලනය කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ව්‍යුහයක් සකස් කිරීම.
- ආරක්ෂිත වාහන පද්ධතියක් ඇති කිරීමට මාර්ග ධාවන යෝග්‍යතා සහතික නිකුත් කිරීමේ වැඩසටහන් සඳහා සහාය ලබාදීම

- පළාත් පාලන ආයතන වලට අයත් ග්‍රාමීය මාර්ග ආශ්‍රිතව රිය අනතුරු බහුල ස්ථානයන් සහ රිය අනතුරු වලක්වා ගැනීම පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- රිය අනතුරු බහුල (Blackspot) ස්ථාන හඳුනාගෙන ඒ පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සඳහා පුවරු සවිකිරීම

**<u>තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීමේ දී මුහුණ දෙන අභියෝග</u>**

- විශාල ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ආයෝජන සපයා ගැනීමේ ගැටලු
- සංවර්ධන ප්‍රමුඛතාවයන් හඳුනාගැනීම ප්‍රායෝගික ක්‍රමවේදයකට අනුව සිදු නොවීම
- ඉඩම් අත්පත් කර ගැනීම, පවරා ගැනීම සහ නැවත පදිංචි කිරීම සම්බන්ධ ගැටළු
- සේවක ගැටලු සහ අනපේක්ෂිත වෘත්තීය සංගම් ක්‍රියාමාර්ග
- ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධව සිදු කරන පර්යේෂණ ප්‍රතිඵල/ සොයාගැනීම්, ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට ප්‍රයෝගිකව යොදා ගැනීමේ දුර්වලතා
- නව තාක්‍ෂණය යොදා ගැනීමේදී ඇතිවන තාක්‍ෂණික ගැටලු

## 06 පරිච්ඡේදය

## මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | | | පවතින සේවක සංඛ්‍යාව | | | ඇබෑර්තු/ අතිරික්ත | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | සෙත්සිරිපාය පරිශ්‍රය | මරදාන පරිශ්‍රය | එකතුව | සෙත්සිරිපාය පරිශ්‍රය | මරදාන පරිශ්‍රය | එකතුව | සෙත්සිරිපාය පරිශ්‍රය | මරදාන පරිශ්‍රය | එකතුව |
| ජ්‍යෙෂ්ඨ | 24 | 15 | 39 | 21 | 09 | 30 | 03 | 06 | 09 |
| තෘතියික | 04 | 03 | 07 | 03 | 01 | 04 | 01 | 02 | 03 |
| ද්විතියික | 96 | 37 | 133 | 135 | 46 | 181 | -39 | -9 | -48 |
| ප්‍රාථමික | 54 | 23 | 77 | 40 | 03 | 43 | 14 | 20 | 34 |

### 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපාන අයුරු

අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර ඉටු කරලීම වෙනුවෙන් ඉලක්කගත අරමුණුවලට ළඟාවීමේදී මානව සම්පත් හිඟය සෘජු බලපෑමක් සිදු කරන අතර, අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට වැයවන කාලසීමාවන්හි වැඩිවීමක් සිදුවීමේ හැකියාවක් ඇත.

රැකියා විරහිත උපාධිධාරීන්ට, රැකියා ලබාදීමේ රජයේ වැඩසටහන යටතේ බඳවා ගන්නා ලද ද්විතියික මට්ටමේ නිලධාරීන් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් මෙම අමාත්‍යාංශය වෙත පුරප්පාඩු ඉක්මවා අනුයුක්ත කර ඇත. කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මගින් කාර්යය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කරමින් සිටින අතර, අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳ කාර්යය මණ්ඩල සංශෝධන කොමිෂන් සභාව දැනුවත් කර ඇත. ඒ අනුව, අතිරික්ත කාර්යය මණ්ඩලය පිළිබඳ තීරණය අමාත්‍යාංශය විසින් ක්‍රියාවට නංවනු ඇත.

### 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රුපියල්) (දේශීය/ විදේශීය) | වැඩසටනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම * |
|---|---|---|---|---|---|
| Seminar on party & government for senior officials from Sri Lanka | 02 | දින 14 | මාර්ගගත ක්‍රමවේදය | විදේශීය | |
| Regional Cooperation Programme 31st Training Course (Online) | 03 | දින 12 | | විදේශීය | |
| Webinar on Smart Transportation | 05 | දින 01 | | විදේශීය | |
| Seventh Session of the Committee on Transport | 05 | දින 03 | | විදේශීය | |
| Fourth Meeting of the BIMSTEC Transport Connectivity working group (BTCWG) 08th December 2022, Thailand | 01 | දින 01 | | විදේශීය | |

| | | | | | |
|---|---|---|---|---|---|
| Seminar on Investment & financing management of Railway infrastructure Construction for Developing Countries from 18th to 31st October 2022 | 04 | දින 14 | | විදේශීය | |
| Note to all UN member states 6th session of the UNECE working party on public private partnership | 01 | දින 02 | | විදේශීය | |
| Launch programme on UNESCAP training course – fundamentals of freight connectivity & logistics in Asia & the Pacific | 01 | දින 01 | මාර්ගගත ක්‍රමවේදය | විදේශීය | |
| Regional Cooperation mechanism on low carbon transport – Sub regional consultation & capacity building workshop | 01 | දින 02 | 24,000.00 | විදේශීය | අරමුණුවලට අදාළ දැනුම තුළින් වාර්තාවක් ලබාදී ඇත. |
| විශ්‍රාම වැටුප් වැඩමුළුව | 04 | දින 01 | 16,000.00 | දේශීය | |
| කාර්යාල සටහන් ලිවීම හා රාජකාරී ලිපි ලිවීමේ පාඨමාලාව | 42 | දින 01 | 10,000.00 | දේශීය | |
| Transport management programme | 04 | දින 02 | 30,000.00 | දේශීය | |
| Invitation to a knowledge session on target for setting for SDG monitoring & evaluation framework for Sri Lanka | 04 | දින 01 | මාර්ගගත ක්‍රමවේදය | දේශීය | |
| අමාත්‍යාංශ මණ්ඩල සංදේශ පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම | 04 | දින 02 | 34,000.00 | දේශීය | |
| ගිණුම්පොත් ක්‍රමානුකූලව නඩත්තු කිරීම | 01 | දින 02 | 7,500.00 | දේශීය | |
| නිවාඩුභාර නිලධාරියාගේ කාර්යභාරය හා වගකීම | 42 | දින 01 | 10,000.00 | දේශීය | |
| හානි පාඩු හා මු.රෙ. 104 යටතේ වූ පරීක්ෂණය | 02 | දින 01 | 10,000.00 | දේශීය | |
| ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම | 02 | දින 01 | 10,000.00 | දේශීය | |
| පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය | 08 | දින 01 | 17,600.00 | දේශීය | |
| රාජ්‍ය සේවයේ නිවාඩු හා වැටුප් පරිවර්තන පිළිබඳ වැඩමුළු | 50 | දින 01 | 22,000.00 | දේශීය | |
| දෙමළ භාෂා පුහුණු වැඩසටහන | 33 | පැය 150 | 86,250.00 | දේශීය | |
| ව්‍යවහාරික ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 01 | අවු. 01 | 12,900.00 | දේශීය | |
| ප්‍රසම්පාදන වැඩමුළුව | 40 | පැය 03 | - | දේශීය | |
| තොරතුරු තාක්ෂණය ප්‍රායෝගික භාවිතාය | 40 | පැය 03 | - | දේශීය | |
| චන්දි හා දීමනා | 40 | පැය 02 | - | දේශීය | |
| මුළු ආයෝජනය | | | 290,250.00 | | |

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන අයුරු

අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් හා අනෙකුත් නිලධාරීන් පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම තුළින් අමාත්‍යාංශය තුළ තමන්ට නියම වී පවතින රාජකාරි වඩාත් නිවැරදිව හා කාර්යක්ෂමව පවත්වා ගැනීමට හැකියාව ලැබී ඇත. තවද මාණ්ඩලික නිලධාරීන් දේශීය පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම තුළින් ලබන අත්දැකීම් තම රාජකාරියට අනුකූල කර ගැනීම හා එමඟින් කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම සිදු කර ඇත. එමෙන්ම විදේශීය පුහුණු ලැබීම තුළින් නිලධාරීන් අභිප්‍රේරණය වන අතර, ඒ තුළින් ලබා ගන්නා දැනුම හා කුසලතා උපයෝගී කර ගනිමින් ප්‍රවාහන ක්ෂේත්‍රයේ සංවර්ධනයක් ඇති කරලීමට හැකියාව ලැබී ඇත. (ඒ හා සම්බන්ධව සහතික පත්‍ර හා වාර්තාවන් අමාත්‍යාංශය වෙත ලබා දී ඇත.)

## 07 පරිච්ඡේදය

### අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජිත කරන නිවැරදි ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූලවේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූලවේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ. | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ. | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ. | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ. | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම | අනුකූලවේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙනයාම | අනුකූලවේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූලවේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූලවේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූලවේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූලවේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූලවේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූලවේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූලවේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූලවේ | | |
| **3** | **මූල්‍ය පාලනය හා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම | අනුකූලවේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූලවේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්මනිලධාරින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූලවේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිගත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදීගණකාධිකාරිවරයන්ගේ | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | පාලනයට යටත්ව කටයුතු කිරීම | | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස්කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූලවේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම | අනුකූලවේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | | සිහිකැඳවීම් යොමුකිරීම සහ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමේදී අදාළ අංශ ප්‍රධානීන් දැනුවත් කිරීම |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම | අනුකූල නොවේ | | රාජ්‍ය අමාත්‍යාංශයේ විෂයපථය වරින්වර වෙනස්වීම නිසා ඇතිවූ තත්වය මීට හේතුවිය. |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදයප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූලවේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූලවේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙනයාම | අනුකූලවේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූලවේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රා.ප.ච. 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූලවේ | | |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූලවේ | | |
| **10** | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූලවේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළපසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූලවේ | | |
| **12** | **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූලවේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූලවේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | | අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම හා ණය ගෙවන ලෙස අදාළ පාර්ශ්වයන් ලිඛිතව දැනුවත් කිරීම |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූලවේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූලවේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූලවේ | | මහාමාර්ග අමාත්‍යාංශය විසින් සිදුකරනු ලැබේ |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | නිරවුල් කර තිබීම | | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම | අනුකූලවේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූලවේ | | මහාමාර්ග අමාත්‍යාංශය විසින් සිදුකරනු ලැබේ |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූලවේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූලවේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරතිබීම | අනුකූලවේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම | අනුකූලවේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූලවේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූලවේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල නොවේ | | 2022 වසර තුළ ප්‍රවාහන විෂය සඳහා කැබිනට් සහ රාජ්‍ය ලෙස අමාත්‍යාංශ දෙකක් පැවතුණු අතර, කැබිනට් අමාත්‍යාංශය මඟින් මෙම අවශ්‍යතා සපුරාලන සක්‍රීය වෙබ් අඩවියක් පවත්වාගෙන යනලදී. නමුත්, මේවන විට පවතින්නේ කැබිනට් අමාත්‍යාංශය පමණි. එබැවින් මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා වෙනම වෙබ් අඩවියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැත |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | | මේ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලස්මක් සකස් කොට තිබීම | අනුකූලවේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූලවේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූලවේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූලවේ | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | **අදාළ නොවේ** | | |